{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
## Department of Education – North Central Province

10 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය :

විෂයය :- බුද්ධ ධර්මය

පාසලේ නම :- ...........................................

ඇතුළත්වීමේ අංකය :- ...........................................

1 පිළිතුරු පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | **3** | 11 | **4** | 21 | **1** | 31 | **2** |
| 02 | **4** | 12 | **3** | 22 | **3** | 32 | **4** |
| 03 | **2** | 13 | **4** | 23 | **4** | 33 | **4** |
| 04 | **3** | 14 | **1** | 24 | **2** | 34 | **1** |
| 05 | **2** | 15 | **2** | 25 | **4** | 35 | **3** |
| 06 | **1** | 16 | **4** | 26 | **1** | 36 | **2** |
| 07 | **1** | 17 | **2** | 27 | **3** | 37 | **3** |
| 08 | **3** | 18 | **1** | 28 | **3** | 38 | **1** |
| 09 | **2** | 19 | **3** | 29 | **4** | 39 | **4** |
| 10 | **2** | 20 | **1** | 30 | **3** | 40 | **2** |

II පත්‍රය – පිළිතුරු

01

I. සර්වමිත්‍ර බමුණු පඬිතුමා සර්වමිත්‍ර බමුණා ලකුණු 02

II. මහල්ලෙක් ,ලෙඩෙක්, මළකඳක් පැවිදි රුවක් ලකුණු 02

III. දෙමව්පියන් ලකුණු 02

IV. අලෝභ, අදෝශ ,අමෝහ ලකුණු 02

V. සමගිවන්න විවාද නොකරන්න. ලකුණු 02

VI. දිට්ඨධම්මවේදනීය කර්ම , උපපජ්ජවේදනීය, කර්ම අපරාපරිය වේදනීය කර්ම ,අහෝසි කර්ම ලකුණු 02

VII. ආහාර මුඛයෙහි තිබියදී කතාබහ නොකිරීම, අතලෙවකමින් ආහාර නොගැනීම, සුරු සුරු හඬ නගමින් ආහාර නොගැනීම යනාදී පිළිතුරු සිසු පිළිතුරු සලකා බලා ලකුණු ලබාදෙන්න වැඩිදුර අධ්‍යයනය සඳහා පිටු අංක 99 අධ්‍යයනය කරන්න. ලකුණු 02

VIII. 1 ගාන්ථාකාර - සණ්ඨාරයක හැඩය
2 සඨාකාර- කලයක හැඩය
3 බුබ්බුලාකාර- දිය බුබුලක හැඩය
4 ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය
5 පද්මාකාර - පියුමක හෙවත් නෙළුම් මලක හැඩය
6 අමලාකාර - නෙල්ලි ගෙඩියක හැඩය ලකුණු 02

IX. දානය,ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය ලකුණු 02

X. ත්‍රිවිධරත්නය පිළිබඳ කරුණු දැන ඇති කරගන්නා පැහැදීම. ලකුණු 02

02

I. උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ
අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති ලකුණු 02

II. 1 **උට්ඨානවතෝ** - උත්සහවන්ත බව, නොපසුබස්නා වීර්යය නොමැලිව කාර්යක්ෂමව ක්‍රියා කිරීම, කාය ශක්තිය හා චිත්ත ශක්තිය නොමඳව යොදවා වැඩ කිරීම

2 **සතිමතෝ** - එළඹ සිටි සිහිය, යහපත් කල්පනාව,සතිය,හරි වැරදි දැක කටයුතු කිරීම,මතක ශක්තිය

3 **සුචිකම්ම-** පිරිසිදුව කටයුතු කිරීම,කයින් වචනයෙන් හා සිතින් නිදොස් දේ කිරීම,පව්කම් අකුසල් නොකොට පින්කම් කුසල් කිරීම

4 **නිසම්මකාරී-** නුවණින් පිරික්සා ,සිතා විමසා කටයුතු කිරීම, රෝග නිදානය විමසා පිළියම් කරන වෙදදුරෙකු මෙන් ක්‍රියා කිරීම, දොස් නිදොස් දේ බලා නිදොස් දේ කිරීම.

5 **සඤ්ඤත** - දමනය වීම,සංයත බව,හික්මීම,ශීලයෙන් කය වචනය හික්ම වීම,සමාධියෙන් සිත හික්මවීම,එම ගුණ ධර්මයන්හි පිහිටා කටයුතු කිරීම.

6 **ධම්මජීවි** - දැහැමිව ජීවත්වීම,සම්මා ආජීවය,මිත්‍යා දිවි පැවැත්මෙන් තොරව ගොවිතැන් වෙළදාම් ආදි යහපත් ජීවිතාවෙන් යුක්තවීම,නිති විරෝධි අයුරින් උපයාගෙන දිවි නොගෙවීම

7 **අප්පමත්ත-** අප්‍රමාදය,ප්‍රමාද නොවීම,ජීවිතයේ අභිවෘද්ධියට දියුණුවට හානිකර දේ නොකිරීම,ජීවිතය ආපස්සට ගෙන යන ක්‍රියාවලින් වැළකී, ජීවිතය ඉදිරියට ගෙන යන ක්‍රියාවන්හි නිරත වීම.

III. සිසු පිළිතුරු සමස්ථයක් සේ සලකා බලා ලකුණු ලබා දෙන්න
(10 ශ්‍රේණිය බුද්ධ ධර්මය 41-44 පිටු අධ්‍යයනය කරන්න)

03

I. භාවේති කුසල ධම්මෙ ආසේවතී වජ්ජේති සිතාතයේදී භාවනා නිබ්භේදක සූත්‍රය
කුසල් දහම් වැඩිදියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි ලකුණු 02

II. ඉන්ද්‍රීය සංවරය - ඇස , කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රිය සංවර කිරීම සති සම්පන්න හිඳීම, සිටීම, පැවිදිවීම ආදී සියලු ක්‍රියාවන්හිදී අවබෝධයෙන් යුතුවීම, සන්තුට්ටිකතා ලද දෙයින් සතුටු වීම

III.
- ලෝභ ,ද්වේශ ,මෝහ ආදී කෙලෙස් සිතිවිලි පාලනය වේ.
- ධාරණ ශක්තිය වැඩිවේ.
- පොතපත පාඩම් කිරීමේදී වෙනදාට වඩා පහසුවක් දැනෙයි.
- සිතෙහි තෘප්තිමත් ස්වභාවයක් ඇති වේ.
- අසහනය නැතිවී ප්‍රසන්න පෙනුමක් ඇතිවේ.
- කායික රෝග පීඩා අඩුවීමෙන් නිරෝගී වේ.

IV. සිත විසිරී යාමට නොදී එකඟ කර ගැනීමට උපකාරී වේ.

04

I. උතුරු දිශාව හිත මිතුරන් නැගෙනහිර දිශාව මව්පියන්

II. ශිෂ්‍යයන්ගෙන් ගුරුවරුන්ට ඉටුවිය යුතු යුතුකම්
1. දුටු විට හුනස්නෙන් නැගිටීම
2. අවශ්‍ය උපස්ථාන කිරීම
3. අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කන් දීම
4. අවශ්‍ය කටයුතු ඉටු කරදීම
5. මැනවින් ඉගෙන ගැනීම

III. සිසු පිළිතුරු සමස්තයක් සේ සලකා ලකුණු ලබාදෙන්න දහය ශ්‍රේණිය බුද්ධ ධර්මය පිටු අංක 52 අධ්‍යයනය කරන්න

05

I. කායික රෝග මානසික රෝග

II.
1. ශරීරගත පිත ධාතුව කිපීමෙන් වැළඳෙන රෝග
2. සෙම් ධාතුව කිපීමෙන් වැළඳෙන රෝග
3. වාතය කිරීමෙන් වැළඳෙන රෝග
4. වාපිත් සෙම් යන තුන් දොස් කිපීමෙන් හටගන්නා රෝග
5. ඍතු විපර්යාස නිසා වැළඳෙන රෝග
6. වැරදි කායික ක්‍රියාකාරකම්වලින් හටගන්නා රෝග
7. අනුන්ගේ උපක්‍රම නිසා හටගන්නා රෝග
8. කර්ම විපාක අනුව හටගන්නා රෝග

III. සිසු පිළිතුරු සමස්තයක් සේ සලකා ලකුණු ලබාදෙන්න දහය ශ්‍රේණිය බුද්ධ ධර්මය පිටු අංක 95-96 අධ්‍යයනය කරන්න

06

I. - පිරිසිදු ථේරවාදී බුදු දහමට වෙනත් දුර්මත වලින් හානි වීම වළක්වා ගැනීම

- එවකට පැවැති බැමිණිතියා සහගත තත්ත්වය

- මහාධාරීය භික්ෂූන්ට රාජ්‍යය අනුග්‍රහය නොලැබීම
- දීර්ඝ කාලීනව පැවැති යුද වාතාවරණය නිසා වනගත වූ භික්ෂූන්ට ධර්මය පවත්වාගෙන යාමට කාය චිත්ත විවේකය නොමැතිවීම
- දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ගෙන් රාජ්‍යයට සිදුවූ බලපෑම්
- ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ ශාසනික පිළිවෙත් පිරිහී තිබීම
- භික්ෂූන් ග්‍රන්ථ ධූරය විදර්ශනා ධූරය ලෙස කණ්ඩායම් දෙකකට බෙදී සිටීම
- ග්‍රන්ථ ධූරය වැඩීමට ත්‍රිපිටකය ලේඛන අරුඪ කිරීම වැදගත් වන බව සිතීම
- ධර්මය ඇසීම ඉගෙනීම හා පර්යේෂණ කිරීම ලේඛනගතව තිබීම වඩාත් වැදගත් බව සිතීම
- අදාළ කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකක් ලබාදෙන්න

II. අනුග්‍රාහය ප්‍රාදේශීය නායකයෙක්
සහභාගී වූ ප්‍රමාණය භික්ෂූන් වහන්සේලා 500 යි.
හඳුන්වන වෙනත් නම් පුස්තකාරූඪ සංගීතිය

III. ප්‍රතිඵල තුනක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න දහය ශ්‍රේණිය බුද්ධ ධර්මය පිටු අංක 104-105 අධ්‍යයනය කරන්න.

07

- කෙටි සටහන්වලට සිසු පිළිතුරු සමස්තයක් සේ සලකා ලකුණු ලබාදෙන්න.

I. වැලිවිට සරණංකර සංඝරාජ නාහිමි 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය 34 -37 දක්වා පිටු අධ්‍යයනය කරන්න.
II. ත්‍රිලක්ෂණය දහය ශ්‍රේණිය බුද්ධ ධර්මය 47 දක්වා පිටු අධ්‍යයනය කරන්න.
III. අපරිහානි ධර්ම සප්ත අපරිහානි ධර්ම දහය ශ්‍රේණියේ බුද්ධ ධර්මය 106- 107 පිටු අධ්‍යයනය කරන්න .
IV. සඳකඩපහණ 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය 103-113-114 පිටු අධ්‍යයනය කරන්න.